# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/59/07/04/04 (2024) ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2023.10. 13

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

පීඨාධිපතිවරුන්

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධ අභියාචනා - 2024**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ගේ 2024 වර්ෂය සඳහා සිදු කරන ලද වාර්ෂික ස්ථාන මාරුවීම් හා බැඳේ.

02. එම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩලයේ තීරණ මේ සමඟ අමුණා ඇත.

03. ඒ අනුව, අභියාචනා මණ්ඩලයේ තීරණය පරිදි අදාළ ස්ථාන මාරුවීම් 2024.01.01 දින සිට ක්‍රියාත්මක වේ. එබැවින්, අනුප්‍රාප්තිකයන් සේවයට වාර්තා කරන තෙක් නොසිට, ස්ථාන මාරුවීම්වලට යටත් සියලුම නිලධාරීන් අදාළ දිනයේ නව සේවා ස්ථානවල රාජකාරි භාර ගැනීමට හැකි වන සේ වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

04. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු නියෝග ලබා ඇති නිලධරයකු නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවක දී, එම නිලධාරියා වෙත ස්ථාන මාරුව ලබා ඇති ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 V වගන්තිය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

ආචාර්ය අයි.එම්.කේ.බී ඉලංගසිංහ
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
අධ්‍යාපන ලේකම් වෙනුවට

සටහන - වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම් දින 14ක් ඇතුළත මේ සමඟ දක්වා ඇති ආකෘති අංක 03 සම්පූර්ණ කර යොමු කළ යුතුය.


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk